ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# සේවක අර්ථසාධක අරමුදල

# නිවේදනයයි

**සියලුම සේවායෝජකයින්ගේ හා සාමාජිකයින්ගේ විශේෂ අවධානයට**

## සාමාජික ගිණුම් ප්‍රකාශ
## 2023 ප්‍රථම අර්ධ වර්ෂය

**2023 ජනවාරි සිට ජූනි දක්වා** සාමාජික ගිණුම්වලට බැර කර ඇති දායක මුදල් දැක්වෙන, **2023 ප්‍රථම අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ,** සේවායෝජකයින් වෙත තැපැල් කර ඇත. එම ගිණුම් ප්‍රකාශ අදාළ සාමාජිකයින් වෙත බෙදා දීමට කටයුතු කරන මෙන් සියලුම සේවායෝජකයින් වෙත මෙයින් දන්වා සිටිමු.

ඒ අනුව, තම සේවායෝජක වෙතින් එම ගිණුම් ප්‍රකාශ ලබා ගන්නා මෙන් සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයින් වෙත මෙයින් දන්වා සිටිමු.

**මෙම ගිණුම් ප්‍රකාශයන්හි සාමාජික නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ බැර කරන ලද දායක මුදල් යනාදියෙහි යම් විෂමතාවයක් වේ නම්, අදාළ නිවැරදි කිරීම් සඳහා අවශ්‍ය කරන ලියකියවිලි තම සේවායෝජකයා මගින් සේවක අර්ථසාධක අරමුදලෙහි අධිකාරී වෙත ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.**

එමෙන්ම, ගිණුම් විස්තර පරීක්ෂා කිරීම සඳහා පහත දක්වා ඇති සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සබැඳිය භාවිතා කර මාර්ගගත සේවාව සමග ලියාපදිංචි වීමට සාමාජිකයින් උනන්දු කරනු ලැබේ.

https://services.epf.lk/Pages/Member/MemberLoginNew.aspx


දුරකථන අංක : සේ.අ.අ. අත්වැල 011-2206642
011-2206690
011-2206691
011-2206692
011-2206693

ෆැක්ස් අංකය : 011-2206694

විද්‍යුත් තැපෑල : epfhelpdesk@cbsl.lk

**නිහාල් ඩී. ලියනගේ**
**අධිකාරී**
සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව, 12 වන මහල, 5 වන කුළුන
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.